# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,487 - 2026 අප්‍රේල් මස 30 බ්‍රහස්පතින්දා - 2026.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 112 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 118 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මැයි මස 22 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මැයි මස 08 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

111 - B 082787 — - (2026/04)
C 1 -

# පිස්කල් විකිණීම

**තෙල්දෙණිය දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීම යි

යසුනාග රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 74, ඩී. එස්. සේනානායක වීදිය,
මහනුවර.

කොළඹ වාණිජ මහාධිකරණ
නඩු අංකය : HC/Civil/502/2009/MR
තෙල්දෙණිය දිසා අධිකරණ
ඇස්කිසි අංකය : 01/26

*..........පැමිණිලිකරු.*

*එදිරිව*

පී. එම්. එෆ්. ෆයිනෑන්ස් පී.එල්.සී.,
(පෙර : පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පී.එල්.සී. නම් වූ)
අංක 21, නවම් මාවත, කොළඹ 02.

*සහ දැනට,*

අංක 361, 361/1, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03.

*...........විත්තිකරු.*

වර්ෂ 2011 ක් වූ ජූනි මස 21 දින දරන කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුව අනුව එකී විත්තිකරු විසින් පැමිණිලිකරුට විරුද්ධව රු. 17,000,000.00 ක මුදලක් 2011 ක් වූ සැප්තැම්බර් මස 21 දින වන විට ගෙවා අවසන් කළ යුතු බවත්, *නැතහොත්* උපලේඛනයේ (අ) සිට (ඌ) දක්වා ඇති විත්තිකරු වෙත උකස් තබන ලද එකී ඉඩම් කොටස් (දැනට ඉතිරිව තිබෙන 567 D පිඹුරෙහි කැබලි අංක 08) විකිණීමෙන් විත්තිකරු වෙත අයවිය යුතු මුදල ලබා ගනු ලබන බවට ද නියම කර ඇති බැවින්,

නඩු ගාස්තු ඇතුලු අයවිය යුතු සියලුම ගාස්තු පැමිණිලිකරු විසින් විත්තිකාර සමාගම වෙත ගෙවිය යුතු බවට ද, (සමථයෙන් පසු මෙතෙක් ගෙවා ඇති රු. 12,494,574.30 ක මුදල අඩුකර) නියම කර ඇති බැවින්, ඉහත සඳහන් පැමිණිලිකරුගේ නිවාස, ඉඩම්, බඩුමුට්ටු, විදුලි උපකරණ, වාහන, යන්ත්‍රෝපකරණ, රැකියාවක නියුතු නම් වැටුප ද, පැමිණිලිකරු සතු යම් ගොඩනැගිල්ලක් වේතොත් මාසික කුළිය ද, වෙනත් භාණ්ඩ හා දේපළ ද, පැමිණිලිකරු සතු බැංකු ගිණුම් තිබේ නම් එකී ගිණුමේ තිබෙන මුදල, චංචල සහ නිශ්චල දේපළ අය විය යුතු ණය සහ බැරකම් තහනම් කිරීමෙන් අවශ්‍ය වුවහොත් විකිණීමෙන් ලබාගත යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටු කිරීමට පැමිණිලිකරු විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණ නඩු අංක HC/Civil/502/2009/MR දරන නඩුව යටතේ පැමිණිලිකරුට එරෙහිව නිකුත් කර ඇති ඇස්කිසිය ප්‍රකාරව, තෙල්දෙණිය දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන ඒ. ඒ. එම්. ඩී. ඩී. අමරසිංහ වන මා විසින් වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 02 දින නිසිලෙස තහනම් කරන ලද පැමිණිලිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2026 ක් වූ මැයි මස 25 දින පෙ. ව. 11.00 ට,**

එකී නිශ්චල දේපළ පිහිටා ඇති ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30ක් ඇතුළත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ, නත්තරම්පොත ගමේ පිහිටි "තල්වත්ත එස්ටේට්" නැමැති ඉඩමේ කොටසක් සඳහා බලයලත් මිනින්දෝරු එල්. ඒ. ඩී. සී. විජේතුංග මහතා විසින් 1983.10.29 දින මැන සාදන ලද අංක 7501 දරන පිඹුරේ කැබලි අංක 02 දරන කොටස සඳහා බලයලත් මිනින්දෝරු පී. ජී. එස්. කේ. ජයරත්න මහතා විසින් 2007.12.02 දින මැන සාදන ලද අංක 545 සහ 546 දරන පිඹුරුවලින් නිරූපිත ඉඩම් කොටස් ඒකාබද්ධ කර නැවත මැන එම මිනින්දෝරු විසින් ම 2008.12.21 දිනැති අංක 567D දරන පිඹුර මගින් කොටස් කරන ලද පිඹුරේ කැබලි අංක 08 දරන ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම බිංදුවයි නවය (පර්. 9.09) ක් විශාල ඉඩම් කොටසට එකී පිඹුර ප්‍රකාරව මායිම්, උතුරට : මෙම පිඹුරේ කැබලි අංක 07 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක 10 සහ කැබලි අංක 05 දරන පාරවල් ද, දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 09 ද, බස්නාහිරට : ඩී. එම්. ඊ. එච්. අමරසේකර සහ තවත් අයට හිමි දේපළ ද යන මායිම් තුළ පිහිටි ඉඩම, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේ ද වේ. මෙම ඉඩම කුණ්ඩසාලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 832/161,E 832/162 පත්ඉරුවල ලියාපදිංචි කර ඇත.

*දේපළට පිවිසීම.*- මහනුවර සිට හේවා හැට මාර්ගයේ කි. මී. 05ක් පමණ යන විට හමුවන තැන්නකුඹුර නගරයේ සිට මහියංගනය මාර්ගය ඔස්සේ යන විට හමුවන නත්තරම්පොත නගරයෙන් මාර්ගයේ දකුණු පසට හමුවන ගල්බංගලාව පාරට පිවිසී ඉදිරියට යන විට හමුවන ගල්බංගලාව සංචාරක හෝටලය පසුකර ඉදිරියට යන විට වම් පසට හමුවන අවසාන හිස් බිම් කොටස වේ.

ඒ. ඒ. එම්. ඩී. ඩී. අමරසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
තෙල්දෙණිය.

වර්ෂ 2026 ක් වූ අප්‍රේල් මස 21 දින,
තෙල්දෙණිය දිසා අධිකරණයේ දී ය.

04 - 347

---

**කුරුණෑගල දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීම යි

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.,
*නොහොත්* සණස සංවර්ධන බැංකුව යන නාමයෙන් ද හැඳින්වෙන,
අංක 12, එඩ්මන්ටන් පාර,
කිරුළපන, කොළඹ 06.

*..........පැමිණිලිකරු.*

කුලියාපිටිය දිසා අධිකරණ
නඩු අංකය : MB/578
කුරුණෑගල දිසා අධිකරණ
ඇස්කිසි අංකය : 11/2026

*එදිරිව*

වඩිග කුලගේ සමන්ත ශ්‍රී රෝහිත,
අංක 162/151,
මාදම්පිටිය පාර, කොළඹ 15.

*...........වින්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ 2024 ක් වූ මැයි මස 10 දින ප්‍රකාශ කරන ලද තීන්දුවට අනුව පැමිණිලිකරුට විත්තිකරුගෙන් රුපියල් පන්ලක්ෂ දහහත්දහස් හාරසිය පනස්දෙකයි ශත විසිඅටක (රු. 517,452.28) මුදලක් ද, රුපියල් හාරලක්ෂ අනූදහස් නවසිය හතළිස් අටයි ශත හැත්තෑහයක (රු. 490,948.76) මුදල මත වර්ෂ 2018 ක් වූ නොවැම්බර් මස 21 දින සිට නඩු තීන්දුව දක්වාත්, නඩු තීන්දු දිනයේ සිට එකී මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන දින දක්වාත් වර්ෂයකට 16% බැගින් පොළී මුදල වන රුපියල් පන්ලක්ෂ හතළිස් දෙදහස් පන්සිය අසූඅටයි ශත අසූ දෙකක (රු. 542,588.82) මුදල හා නඩු ගාස්තු වන රුපියල් හතළිස් හයදහස් පන්සියයක (රු. 46,500.00) මුදල එනම් සම්පූර්ණ මුදල වන රුපියල් එකොලොස් ලක්ෂ හයදහස් පන්සිය හතළිස් එකයි ශත දහයක (රු. 1,106,541.10) මුදලක් විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා පැමිණිලිකරුට අයිතිය ඇති බවත්,

විත්තිකරු විසින් ඉහත සඳහන් මුදල නොගෙවන්නේ නම් අවශ්‍ය වුවහොත් ඉහත කී විත්තිකරුගේ ගෙවල්, ඉඩම්, බඩුමුට්ටු අයවිය යුතු ණය සඳහා හා බැරකම් තහනම් කිරීමෙන් අවශ්‍ය වුවහොත් ඒවා විකිණීමෙන් ලබාගත යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටු කිරීමට විත්තිකරු විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කුලියාපිටිය දිසා අධිකරණ නඩු අංක MB/578 දරන නඩුව යටතේ නිකුත් කර ඇති ඇස්කීසිය ප්‍රකාරව, කුරුණෑගල දිසා අධිකරණයේ පූර්ව රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල් වන එම්. එම්. ඒ. ගුණසේකර මහත්මිය විසින් වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 25 දින නිසි ලෙස තහනම් කරන ලද විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ, කුරුණෑගල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින්,

**වර්ෂ 2026 ක් වූ ජුනි මස 02 දින ප. ව. 1.00 ට,**

එකී නිශ්චල දේපළ පිහිටා ඇති ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30ක් ඇතුළත කුළියාපිටිය දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සහ අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ, දඹදෙණි හත්පත්තුවේ, උඩුකහ දකුණු කෝරළේ, හුම්බුළුව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හුම්බුළුව ගමේ පිහිටි "පිල්ලෑවේ වත්ත *හෙවත්* පරණ වත්ත" නැමැති ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. ඒ. අමරතුංග විසින් වර්ෂ 2017ක් වූ ජුනි 24 දින මැන සාදන ලද අංක 12173 දරන පිඹුරේ කැබලි අංක 01 දරන, උතුරු නැගෙනහිරට : ඇල ද, දකුණු බස්නාහිරට : අංක 1304 දරන පිඹුරේ කැබලි අංක 02 ද, උතුරු බස්නාහිරට : අංක 214 දරන පිඹුරේ කැබලි අංක 14 දරන පාරක් සඳහා ලකුණු කළ බිම් කොටස සහ කැබලි අංක 12 ද, යන මායිම් තුළ පර්චස් විසි එක (පර්. 21) ක් විශාල ත්‍රිකෝණාකාර ඉඩම සහ ඊට අයත් සැම සියළු දෙය ද සමඟ බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක මහතා විසින් වර්ෂ 1992.08.29 දින මැන සාදන ලද අංක 214 දරන පිඹුරේ කැබලි අංක 14 දරන පාරේ පරවශ්‍යතා අයිතිය සමග ද වේ. කුරුණෑගල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ U/127/97 හි ලියාපදිංචි වී ඇත.

**ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ඉඩමට කරන ලද නව මැනුමකි.**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සහ අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ, දඹදෙනි හත්පත්තුවේ, උඩුකහ දකුණු කෝරළේ, හුම්බුළුව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හුම්බුළුව ගමේ පිහිටි 'පිල්ලෑවේ වත්ත *හෙවත්* පරණ වත්ත" නැමැති ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් වර්ෂ 1992 ක් වූ අගෝස්තු මස 29 දින මැන සාදන ලද අංක 214 දරන පිඹුරේ කැබලි අංක 13 දරන උතුරට : කැබලි අංක 14 සහ 12 දරන පාර ද, නැගෙනහිරට : ගොඩ ඇල ද, දකුණු බස්නාහිරට : අංක 1304 දරන පිඹුරේ කැබලි අංක 02 ද යන මායිම් තුළ පර්චස් විසි එක (පර්. 21) ක් විශාල ත්‍රිකෝණාකාර ඉඩම සහ ඊට අයත් සැම සියලු දෙය ද වේ. කුරුණෑගල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ U/127/97 හි ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසීම.*- අලව්ව සිට ගිරිඋල්ල මාර්ගයේ කි. මී. 03ක් පමණ යන විට මාර්ගයේ වම් පසට හමුවන ඇහළුම් කර්මාන්තශාලාව පසුකර කි. මී. 01 ක් පමණ යන විට මාර්ගයේ දකුණු පසට හමුවන ටයර් අලෙවිසැල අසලින් ඇති පාරට හැරී ඉදිරියට යන විට හමුවන වෙල්යායට යාබදව මාර්ගයේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කුරුණෑගල.

වර්ෂ 2026 ක් වූ අප්‍රේල් මස 22 දින,
කුරුණෑගල දිසා අධිකරණයේ දී ය.

04-346

**කුරුණෑගල දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මහජන බැංකුව, අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

දැනට - මහජන බැංකුව, අංක 374, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.

නඩු අංකය : 1755/උකස්
ඇස්කිසි අංකය : 25/2023

*...........පැමිණිලිකරු.*

*එදිරිව*

1. කුරුණෑගල, මල්කඩුවාව, ගමමැද පාර, 5 වන පටුමගෙහි "සුදත් දේපළ වෙළෙඳාම්" යන නාමයෙන් ව්‍යාපාර පවත්වාගෙන යන කුරුණෑගල, වැහැර නිශ්ශංක මාවතේ, අංක 8/6 හි පදිංචි කලුඅප්පු හැන්නැදිගේ සුදත් වන්දන

දැනට - පස්වන පටුමග, ගමමැද පාර, මීගමු පාර, මල්කඩුවාව.

2. කුරුණෑගල, වැහැර, නිශ්ශංක මාවත, අංක 8/6 හි පදිංචි ඉලංකෝන් මුදලිගේ දොන් මුදිතා කුමාරි ඉලංකෝන්

දැනට - පස්වන පටුමග, ගමමැද පාර, මීගමු පාර, මල්කඩුවාව.

*............විත්තිකරුවන්.*

කුරුණෑගල දිසා අධිකරණයේ අංක 1755/උකස් නඩුව ප්‍රකාරව 2021 ක් වූ මාර්තු මස 22 දිනැති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව මා වෙත ප්‍රකාශ කර ඇති ඇස්කිසි ආඥාවේ බලය ප්‍රකාරව මෙසේ ලියා දක්වමි.

ඉහත අංක දරන නඩුවේ 2021 ක් වූ මාර්තු මස 22 දිනැති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව ඉහත කී පැමිණිලිකාර බැංකුවට අයවිය යුතුව ඇති රුපියල් දහනව ලක්ෂ එක්දහස් හයයි ශත හතර (රු. 1,901,006.04) ක මුදල සහ එම මුදලට 2012.07.31 දින සිට සම්පූර්ණ මුදල ගෙවනු ලබන දින දක්වා 24%ක ප්‍රමාණයට පොළිය යන මුදල සහ නඩු ගාස්තු ඉහත සඳහන් විත්තිකාර නුබලා විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශයක් කර ඇත.

තව ද, ඉහත මුදල නිසි පරිදි ගෙවීම විත්තිකරුවන් විසින් පැහැර හැර ඇති නිසා එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසි බලය පිට එම මුදල් අයකර දීම සඳහා පූර්වගාමී රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් විසින් 2023.07.12 දින තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ සවිස්තරව සඳහන් නිශ්චල දේපළේ හිමිකම් අයිතිවාසිකම් හා ඊට අදාළ සෑම සියලු දේ,

**වර්ෂ 2026 මැයි මස 26 දින ප.ව. 1.30 ට,**

එකී දේපළ පිහිටි ස්ථානයේ දී රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ලි හත්පත්තුවේ, තිරගන්දහය කෝරළේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බමුණාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බමුණාවල නමැති ගමේ පිහිටි "තොටුපලගාව පිල්ලෑව දැනට වත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. බී. අබේරත්න මහතා විසින් 2006.05.07 දින මැන සාදන ලද අංක 3842 දරන පිඹුරේ සඳහන් කැබලි අංක එක්ස් දරන ඉඩමට මායිම්,

උතුරට : පාර ද,
නැගෙනහිරට : අංක 110/84 පිඹුරේ කැබලි අංක 02 ද,
දකුණට : ඇළ ද,
බටහිරට : පෙර ඒ. එම්. ඩිංගිරි බණ්ඩාගේ උරුමකරුවන්ට අයිතිව තිබී දැනට ඒ. එම්. පී. අධිකාරිට අයිති ඉඩම ද,

යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් විස්සක් (රූඩ් 01, පර්. 20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී ඇතුළු සියලු දේ ද වේ. (ලියාපදිංචිය ඒ 1682/239 - කුරුණෑගල/ජී/124/35).

ඊ. එච්. පොඩිමැණිකේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්/සාමවිනිසුරු,
දිසා අධිකරණය - කුරුණෑගල.

වර්ෂ 2026 ක් වූ අප්‍රේල් මස 16 දින දී ය.

04-356

---

## නුවරඑළිය දිසා අධිකරණයේ දී ය

### සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

1994 අංක 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් හා සම්බන්ධ කාරණය පිළිබඳවයි.

නඩු අංකය : 230/21/DR
ස්වභාවය : ණය අයකර ගැනීම
වටිනාකම : රු. 6,901,833.57
ඇස්කිසි අංකය :

සෙලාන් බැන්ක් පීඑල්සී,
සෙලාන් ටවර්ස්, අංක 90,
ගාළු පාර, කොළඹ 03.

*...........පැමිණිලිකරු.*

*- එදිරිව -*

"සන්ෂයින් වෙජී මාර්ට්" යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන

රාජපක්ෂ වාසල හිටිහාමිලාගේ දේවින්ද නුවන් රාජපක්ෂ,
අංක බී 20, යෝජිත ආර්ථික මධ්‍යස්ථානය,
නුවරඑළිය.

*...........විත්තිකරු.*

නුවරඑළිය දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2023 ක් වූ නොවැම්බර් මස 07 දිනැති නියත ආඥාව ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුව වෙත ස්ථිර අයිරා පහසුකම් මත වර්ෂ 2020.11.11 දින වන විට රුපියල් හතලිස් තුන් ලක්ෂ අසූ තුන් දහස් හත්සිය පනස් එකයි ශත හතක් (4,383,751/07) මුදලක් සහ එකී මුදල මත වර්ෂ 2020/11/12 දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් වසරකට 28% බැගින් වන පොළිය ද සමග ගෙවීමටත්,

තව ද කාලීන ණය පහසුකම මත වර්ෂ 2020/11/11 දින වන විට අයවිය යුතු රුපියල් විසිපන් ලක්ෂ දහඅට දහස් අසූ දෙකයි ශත පනහක (රු. 2,518,082/50) මුදලක් සහ රුපියල් දහ නම ලක්ෂ පනස් අට දහස් තුන්සිය තිස් තුනයි ශත විසි නමයක (1,958,333/29) මුදල මත වර්ෂ 2020/11/12 වන දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් වසරකට 17% බැගින් වන පොළිය ද සමග ගෙවීමටත්,

තව ද, අධිකරණයේ නිළධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ගෙවීමටත් නියත ආඥාවක් ලබා දී ඇති හෙයින් ද, ඒ අනුව විත්තිකරුට එරෙහිව ක්‍රියාවේ යෙදවීම සඳහා මා වෙත නිකුත් කර ඇති ඇස්කිසියේ පත්‍රයේ බලය පිට දැනටමත් තහනමට ගෙන ඇති,

මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති සහ තවදුරටත් පැමිණිලිකාර බැංකුව වෙතට බැඳී ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2026 ක් වූ මැයි මස 26 දින පෙ. ව. 11.30 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔයපළාත කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 476 H මීපිල්ලිමාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර සහ වඩාත් නිවැරදිව සීතාඑළිය ගමේ පිහිටි "ශ්‍රී ජයවර්ධනපුර" නමැති ඉඩමේ කොටසකට බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් මැන සාදන ලද අංක 16751 සහ වර්ෂ 2017/11/18 දිනැති පිඹුරෙහි නිරූපිත ලොට් 1 දරන බිම් කොටස සඳහා මායිම්,

උතුරට : BOD Nuv/79/2 හි ලොට් 72 සහ පාර ද ;
නැගෙනහිරට : BOD Nuv/79/2 හි ලොට් 70 සහ පාර ද ;
දකුණට : BOD Nuv/79/2 හි ලොට් 70 ද ;
බස්නාහිරට : BOD Nuv/79/2 හි ලොට් 92 සහ ලොට් 92 ද ;

යන මායිම් තුළ වූ රූඩ් දෙකක් (රූඩ් 2) ක් විශාලත්වයෙන් යුතු ඉඩම සහ එහි පිහිටි අනෙකුත් සියලු දේ ද සමග වේ.

### උපලේඛනය

*රක්ෂිත වගන්ති :*

01) ඉඩමෙහි හා එය මතුපිට ඇති සියලු ඛණිජ ද්‍රව්‍ය (මේ ප්‍රධාන පත්‍රයෙහි ඛණිජ ද්‍රව්‍ය යන යෙදුම සම්බන්ධයෙන් මැණික් ගල් ද ඇතුළත් වේ.) පිළිබඳ හිමිකම් හා එවැනි යම් ඛණිජ ද්‍රව්‍ය හෑරීමේ, සෙවීමේ ඒ පිළිබඳව කටයුතු කිරීමේ හා බැහැර ගෙන යාමේ අයිතිය රජය වෙත වෙන්කර තබාගනු ලැබේ.

02) ඉඩමට ඇති අයිතිකරුගේ හිමිකම් මේ ප්‍රධාන පත්‍රයේ දිනට එම ඉඩම මත ඇති මාර්ග අයිතියකට හෝ වෙනත් පාරවශ්‍යතාවයකට යටත් විය යුතුය.

*කොන්දේසි.-*

01) මෙම ඉඩමේ බෙදා වෙන්කළ කොටසක් අයිතිකරු විසින් බැහැර නොකළ යුතු ය.
02) මෙම ඉඩමේ නොබෙදා වෙන්කළ කොටසක් අයිතිකරු විසින් බැහැර නොකළ යුතු ය.
03) ඉඩමේ බෙදූ කොටසකට කිසිම තැනැත්තෙකු අයිතිකරු නොවිය යුතු ය.
04) ඉඩමේ නොබෙදූ කොටසකට කිසිම තැනැත්තෙකු අයිතිකරු නොවිය යුතු ය.
05) ඉදිකරන ලද හෝ ඉදිකරගෙන යනු ලබන හෝ මින්මතු ඉදිකරනු ලබන වාරිමාර්ග ක්‍රමයකින් මේ බිම් කොටසට හෝ එහි යම් කොටසකට වාරි මාර්ග පහසුකම් සපයා ඇත්තේ නම් හෝ සපයනු ලැබුවහොත් එකී වාරිමාර්ග පහසුකම් සැලසෙන බිම් කොටස සම්බන්ධයෙන් අයිතිකරු (453 අධිකාරිය වූ) වාරිමාර්ග ආඥාපනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද යම් රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය.
06) දිසාපතිවරයාගෙන් ලිඛිත අවසරය දී උචිත බලධාරියාගෙන් බලපත්‍රයක් ද ලබා ඇත්නම් මිස අයිතිකරු විසින් ඉඩමෙහි හෝ ඒ මතුපිට කිසිම ඛණිජ ද්‍රව්‍යයක් කැණීම, සෙවීම, ලබාගැනීම, තමාගේ ප්‍රයෝජනයට ගැනීම, විකිණීම, අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකළ යුතු ය.

*දේපළට ගමන් මග.-* මීපිල්ලිමාන විශේෂ කාර්ය කඳවුර හන්දිය අසල සිට ශ්‍රී ජයවර්ධනපුර කොළණි පාරෙන් මීටර් 500 ක් පැමිණ වමට ඇති පාරෙන් තවත් මීටර් 500ක් පැමිණෙන්න. පසුව හමුවන දෙවන ඉඩම් කොටස මෙම විෂයගත දේපළ දකුණට වන්නට පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) සම්පූර්ණ මුදල ගෙවන්නේ නැතිනම් ගැණුම් මිලෙන් 25%
(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද,

ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නුවරඑළිය දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාල සීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමණාකරු.- දේපළ අංශය, සෙලාන් බැන්ක්, අංක 90, ගාළු පාර, කොළඹ 03.

011-2456485, 011-2456479, 011-2456473

දමයන්ති නවරත්න,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - නුවරඑළිය.

04-410

---

# විවිධ දැන්වීම්

## පාර්ලිමේන්තුව

### අමිර්තලිංගම් අනුස්මරණ පදනම සංස්ථාගත කිරීම සඳහාවන පනතකි

ආචාර්ය එස්. ශ්‍රී බවානන්දරාජා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ 'අමිර්තලිංගම් අනුස්මරණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි. " යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි.

1. සිංහල, ඉංග්‍රීසි, දෙමළ වැනි භාෂාවන් හා වෘත්තීය පුහුණු පාඨමාලා ප්‍රවර්ධනය කිරීම, ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම ;

2. ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන් අතර සාමය, හොඳහිත, අවබෝධය හා සහයෝගය වර්ධනය කිරීම, ආරම්භ කිරීම ; සහ

3. ඉස්ලාමීය ආගමට සම්බන්ධ දේශන, සම්මේලන, කණ්ඩායම් සාකච්ඡා සහ සංස්කෘතික සහ අධ්‍යාපනික වැඩසටහන් පවත්වාගෙන යාම ;

යනාදිය වේ.

ආචාර්ය එස්. ශ්‍රී බවානන්දරාජා,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක.

04 - 341

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.